# අභිලේඛන මූලාශ්‍රය මඟින් හෙළිවන නිශ්ශඞ්කමල්ල රජතුමාගේ බෞද්ධ ආගමික ප්‍රතිපත්තිය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ඒ. ඩී. ඒ. එල්. ඩී. සෙනෙවිරත්න[1]

## හැඳින්වීම

රජරට ශිෂ්ටාචාරයේ පැවැති අවසන් රාජධානිය ලෙස පොළොන්නරුව හඳුනා ගත හැකි ය. සියවස් දෙකක් තරම් කෙටි කාලයක් පැවැති මෙම රාජධානියේ ප්‍රබල පාලකයන් කිහිප දෙනෙකුගේ පාලනයක් පැවැති බව මූලාශ්‍රය සාධක මඟින් පැහැදිලි වේ. එම පාලකයන් අතර අවසන් වර සිටි ප්‍රබල පාලකයෙක් ලෙස නිශ්ශඞ්කමල්ල රජුගේ (ක්‍රි.ව. 1186-1197) පාලන අවධිය හඳුනා ගත හැකි ය.

## පර්යේෂණ අරමුණ

නිශ්ශඞ්කමල්ල රජතුමාගේ පාලන අවධියේ දී බුදුදහමට හිමි වූ ස්ථානය හඳුනා ගැනීම පර්යේෂණ අරමුණ වේ.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සිදු කිරීමේ දී න්‍යායාත්මක අධ්‍යයන ක්‍රමවේදය යොදාගත් අතර, එහි දී පුස්තකාල භාවිතය මඟින් නිශ්ශඞ්කමල්ල රජුගේ පාලන සමයට අයත් අභිලේඛන මූලාශ්‍රයන් පරිශීලනය කරමින් අධ්‍යයනය සිදු කරන ලදී.

## පර්යේෂණ ගැටලුව

නිශ්ශඞ්කමල්ල රජුගේ අභිලේඛන මූලාශ්‍රය මඟින් බෞද්ධ ආගමික ප්‍රතිපත්තීන්ගේ ආභාසයක් සන්නිවේදනය වේ ද? යන්න පර්යේෂණ ගැටලුව මත දත්ත රැස් කිරීම සිදු කරන ලදී.

## පර්යේෂණ සාහිත්‍ය විමර්ශනය

කොත්මලේ අමරවංශ හිමි, ලක්දිව සෙල්ලිපි, 1969.

මෙම මූලාශ්‍රය මඟින් පර්යේෂණයට අදාළ පොළොන්නරුවේ අභිලේඛන පිළිබඳ ව තොරතුරු ලබා ගැනීමට හැකි වේ.

D. M. DE. ZILVA WICKRAMASINGHE¸ EPIGRAPHAIA ZEYLANICA-II 1928.

නිශ්ශඞ්කමල්ල රජුගේ පාලන කාලයට අයත් අභිලේඛන මූලාශ්‍රය රැසක් මෙම ග්‍රන්ථයේ ඇතුළත් වන අතර, පර්යේෂණ ගැටලුවට අදාළ වැදගත් තොරතුරු මෙහි සඳහන් වේ.

---

[1]. ඉතිහාසය (විශේෂ), ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලය. *asithasenavirathna91@gmail.com*

සද්ධාමඞ්ගල කරුණාරත්න, ශිලාලේඛන සඞ්ග්‍රහය I වෙළුම, 2000.

නිශ්ශඞ්කමල්ල රජුගේ පාලන ප්‍රතිපත්තිය සම්බන්ධ තොරතුරු ඇතුළත් අභිලේඛනයන් මෙහි අන්තර්ගත වේ.

ඉහත මූලාශ්‍රයන් මඟින් පොළොන්නරුව අවධියේ අභිලේඛනයන් හා නිශ්ශඞ්කමල්ල රජුගේ අවධියට අයත් අභිලේඛනයන් පිළිබඳ ව විස්තර ඇතුළත්ව පැවැතියත් ඍජුව ම නිශ්ශඞ්කමල්ල රජුගේ අභිලේඛන මූලාශ්‍රය මඟින් බෞද්ධ  ආගමික ප්‍රතිපත්තීන්ගේ ආභාසයක් ලබා තිබේ ද යන්න හඳුන්වා නොමැත. එය විමර්ශනාත්මකව විශ්ලේෂණය කිරීම මෙමඟින් සිදු කරනු ලබයි.

**පර්යේෂණ සාකච්ඡාව**

පොළොන්නරුව පාලන අවධියේ සිටි වැදගත් පාලකයෙක් ලෙස නිශ්ශඞ්කමල්ල රජු හඳුනා ගත හැකි ය. ඔහු ලංකාවේ වැඩිම සෙල්ලිපි සඞ්ඛ්‍යාවක් ප්‍රතිෂ්ඨාපනය කරන ලද පාලකයා ද වේ. නිශ්ශඞ්කමල්ල රජු සිය අභිලේඛනයෙන් සන්නිවේදනය කරන්නේ **"බුදුසසුනට හිමි ලක්දිවට අබෞද්ධ චෝළ කෙරළාදී රජ දරුවෝ ද නො තැකිය යුත්තාහ"** යනුවෙනි. මේ අනුව රාජ්‍යත්වයට පත් වීමේ දී බුදුසසුනේ චිරස්ථිතිය සඳහා පාලකයා පත් විය යුතු බවත් එලෙස නොමැති කෙනෙකුට ලක්දිව රාජ්‍යත්වය උරුම නො වන බව පෙන්වා දී ඇත. දළදා වහන්සේ පිළිබඳ ව රජු කෙරෙහි විශේෂ ගෞරවයක් පැවැති බව හැටදාගෙයි අභිලේඛනයේ සඳහන් වේ. **"දළදා පාත්‍ර ධාතුන් වහන්සෙ ට ඖරෙහි දා වීරබාහු මහපාණන්වහන්සෙ පුදා උන්වහන්සෙ ගළවන සඳහා අනගි රුවනින් විසිතුරු සතරන් ද ගබක් කරවා දළදා වඩා බොහො පූජාකොටැ"** යනුවෙන් නිශ්ශඞ්කමල්ල රජු විසින් තමන්ගේ පුතා වූ වීරබාහු ආදිපාදවරයා දළදා වහන්සේට හා පාත්‍රා ධාතුන් වහන්සේට පූජා කොට නැවත රුවනින් විසිතුරු සන රන් දාගැබක් කරවා ධාතුන් වහන්සේලාට බොහෝ පූජා කොට පුත් කුමරුන් නිදහස් කරගත් බව සඳහන් කර ඇත. නිශ්ශඞ්කමල්ල රජු විසින් සතර සඞ්ග්‍රහවස්තුවෙන් හා දස රාජධර්මයෙන් රාජ්‍ය විචාල බව ඔහුගේ අභිලේඛන සාධක පවතී. රජුට අයත් ගල්පොත අභිලේඛනයේ සඳහන් වන්නේ **"මෙසේ චතුස්ස(ග්‍ර)හවස්තුයෙන් ලොකශාසන සනහා...."** යනුවෙන් සතර සඞ්ග්‍රහවස්තුවට අනුව ලෝකශාසන සේවයන්ගේ නිරත වූ බව ය. කාලිඞ්ග උයනේ ගල් ආසන අභිලේඛනය මගින් **"ලක්දිවු වැඩැ දශරාජධර්මයෙන් රාජ්‍ය කෙරෙමින්...."** යනුවෙන් ලංකා රාජ්‍යය දස රාජධර්මයෙන් පාලනය සිදු කළ බව පෙන්වා දී ඇත. සමකාලීන ව පොළොන්නරුව රන්කොත් දාගැබ් ගල් ආසනලිපිය, පොළොන්නරුව උතුරු වාහල්කඩ දොරටු අභිලේඛනය හා නිශ්ශඞ්කමල්ල රජුගේ ප්‍රීතිදානක මණ්ඩප අභිලේඛනයන් මඟින් දස රාජධර්ම සඞ්කල්පය ක්‍රියාත්මක කර වූ බව සඳහන් කර ඇත. මේ අනුව බුදුදහමේ සඳහන් වන බෞද්ධ පාලකයෙක් විසින් අනුගමනය කළ යුතු බෞද්ධ ප්‍රතිපත්තීන් නිශ්ශඞ්කමල්ල රජතුමා ක්‍රියාත්මක කළ බව අභිලේඛන සාධකයන්ගෙන් හඳුනා ගත හැකි ය.

බුදුදහම තුළ සත්ව හිංසාව හා ප්‍රාණඝාතය සම්පූර්ණයෙන් හෙළා දකින අතර, අභයදානය සඞ්කල්පය අගය කරන ලද දහමක් වේ. බෞද්ධ ප්‍රතිපත්තිවල වැදගත් ප්‍රතිපත්තියක් ලෙස අභයදාන සඞ්කල්පය හඳුන්වා තිබේ. මෙම සඞ්කල්පය තමන්ගේ පාලන කාලය තුළ ක්‍රියාත්මක කළ බව නිශ්ශඞ්කමල්ල

රජුගේ අභිලේඛන මගින් පැහැදිලි වේ. ගල්පොත ශිලා ලිපියේ "**ඒ ඒ රටැ සුභික්‍ෂකොටැ එහි සත්‍වයනට අභයදාන දී....**" යනුවෙන් රාජ්‍යයේ සියලු ම සත්‍වයන්ගේ ජීවිත සුරක්ෂිත කළ යුතු බව අවධාරණය කර ඇත. හැටදාගෙයි ඉදිරිපස අභිලේඛනයේ "**මහ වැ තැනැ ප්‍රාණීන්ට අභය දී....**" මහවැව්වල වාසය කරන සියලු ම ජීවීන්ගේ ජීවිත සුරක්ෂිත කළ යුතු ය යන්න අණ කොට ඇත. නිශ්ශඞ්කමල්ල රජුගේ කාලිඞ්ග කැලේ ගල් ආසන ලිපිය මගින් හා කලා ක්‍රීඩා විනෝද ගල් ආසන ලිපිය මගින් ද අභයදාන සඞ්කල්පය ක්‍රියාත්මක කළ යුතු බව අවධාරණය කර ඇත. "**සතලිස්ලක්‍ෂයක් මසුරනින් පූජා කොටැ නුවරට හාත්පසින් සත් ගව්වක් පමණ තැනැ හැමැ සතුන් නො මැරිය හැක්කැයි අභය දී බෙර ලවා දොළොස් මහ වැ තැනැ මසුන්ට අභය දී........පක්‍ෂීන් නො බඳවා නියාවෙන් සම්මත කොට පක්‍ෂීන්ට අභය දී ...........**" මේ අනුව නිශ්ශඞ්කමල්ල රජු රුවන්වැලිසෑය පිහිටි භූමියෙන් ගව් හතක් පුරාවට සතුන් නො මැරිය යුතු බවත් මහවැව්වල සතුන් නො මැරිය යුතු බවත් පූජා නගරයේ ඉහළ අහසේ සැරිසරන කුරුල්ලන් නො මැරිය යුතු බවත් දක්වමින් නිතී පනවා ඇති අයුරු හඳුනා ගත හැකි ය. මිනිසා මෙන් ම තිරශ්චීන යැයි සම්මත සිව්පා, මත්ස්‍ය, පක්ෂි ආදී සෑම සත්‍වයකුට ම අභයදානය ලබා දීමට කටයුතු කරන ලදී. රන්කොත් දාගැබ් ගල් ආසන ලිපිය මගින් "**තුන් රජයෙහි නොයෙක් මහවැතැ නැ අශෙෂ ප්‍රාණීන් ට අභය දී නො මරනනියාවෙන් සමමත කොටැ වී....**" යනුවෙන් රාජ්‍යයේ සමස්ත වෙසෙන සතුන්ට ද මනුෂ්‍යයන්ට ද නිශ්ශඞ්කමල්ල රජු විසින් අභයදානය දී ඇති බව සන්නිවේදනය කර ඇත.

මේ අනුව අභයදාන සඞ්කල්පය ප්‍රායෝගිකව සමස්ත රාජ්‍ය තන්ත්‍රය පුරා ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීමෙන් රජු බෞද්ධ ආගමික ප්‍රතිපත්තින්ගේ ආභාසය ලබා තිබෙන බව හඳුනා ගත හැකි ය.

බෞද්ධ පාලයකුගේ ප්‍රධාන රාජ්‍ය කාර්යභාරයක් වනුයේ ශාසනය ආරක්‍ෂා කිරීම හා බුදුදහම චිරස්ථිත කිරීම වේ. මෙම වගකීම පුරාතන යුගයේ සිට ම ලක්දිව සෑම පාලකයෙක් ම හැකි තාක් ඉටු කිරීමට බැඳී සිටි බවට සාධක සාහිත්‍යය හා පුරාවිද්‍යා මූලාශ්‍රය මගින් හඳුනා ගත හැකි ය. මේ ප්‍රතිපත්තිය අනුගමනය කරමින් නිශ්ශඞ්කමල්ල රජු බෞද්ධ වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය හා ප්‍රතිෂ්ඨාපනය සිදු කළ බව ඔහුගේ අභිලේඛන සාධක මගින් පැහැදිලි වේ. නිශ්ශඞ්කමල්ල පුවරුලිපිය මගින් " **රුවැන්වැලිදාගැබ්වහන්සෙ දා වඳනා පිණිසැ සියුරඟ සෙනෙඟ පිරිවරා මහානුභාවයෙන් තමන්වහන්සේට සතරවන්නෙහි නික්මැ දාගැබ්වහන්සේ පෙනෙන මානයෙහි දී මැ වාහනයෙන් බැසැ ශ්‍රීපාදයෙන් රුවන්වැලිමළුවට වැඩැ මළුවෙහි**" නිශ්ශඞ්කමල්ල රජු තුළ පැවැති ආගමික ශ්‍රද්ධාව නිසාවෙන් රුවැන්වැලි සෑය පැවැති ආගමික උත්සවයට සම්බන්ධ වීමට පැමිණීමේ දී රුවැන්වැලිසෑ දාගබ් පෙනෙන මානයේ දී තමන් පැමිණෙමින් සිටි රථයෙන් බැසැ පාගමනින් රුවැන්වැලිසෑයට පැමිණ එහි සිදු කළ පූජාවට සම්බන්ධ වී ඇති ආකාරයක් විස්තර කර ඇත. නිශ්ශඞ්කමල්ල රජු විසින් ගල්පොත ශිලාලිපියේ ආගමික ගොඩනැගිලි සිදු කර ඇති බව හඳුනා ගත හැකි ය. "**ශිලාමය වෙහෙර දාගබ් සාකොටැ උපකාරචෛත්‍ය කරවා රජගෙට උතුරුදිශා අසු අත් රුවන්මැලිදාගබ්වහන්සේ කරවා**" යනුවෙන් රන්කොත් වෙහෙර කරවන ලද බවත් සඳහන් වේ. රන්කොත් වෙහෙර සඳහා භාවිත කරනු ලැබූ නාමය වනුයේ රුවැන්වැලි දාගැබ යන නාමය වේ. මෙම දාගැබ බඹ අසූවක උසකින් යුක්ත වන බව ද මෙම අභිලේඛනයේ සඳහන් වේ. නිශ්ශඞ්කමල්ල රජුගේ ප්‍රීතිදානක මණ්ඩප අභිලේඛනයේ රජු විසින් ගොඩනගන ලද වෙහෙර විහාරස්ථාන රාශියක් පිළිබඳ ව සාධක හඳුනා ගත හැකි ය.

ශාසනයේ චිරස්ථිතිය සඳහා ද කටයුතු සිදු කළ බව අභිලේඛන මඟින් හඳුනා ගත හැකි ය. නිශ්ශඞ්කමල්ල රජුගේ හැටදාගෙයි ඇතුළත බිත්තියේ ඇති අභිලේඛනයේ දී පැවිදි කිරීමේ දී කූට හා කෛරාටික බුද්ධිය නැති පාපි පුද්ගලයන් බව නිසි විචාරයකින් තොර ව මහණ නො කරන ලෙස උපාධ්‍යාය මහ තෙරවරුන්ට දක්වා තිබේ. එම භික්ෂූන් නිසා ශාසනය පිරිහීම සිදු වන බව දක්වා ඇත. එමෙන් ම නිශ්ශඞ්කමල්ල රජතුමා ශාසනයේ පැවැත්ම සඳහා භික්ෂූන් අතර සමඟිය තිබීම වැදගත් බව අවධාරණය කර ඇත."**ලොකශාසන සමඞ කොටැ**" ශාසනය සමගි සිදු කර යනුවෙන් හැටදාගෙයි ඉදිරිපස පුවරුලිපියේ සඳහන් කර ඇත. නිශ්ශඞ්කමල්ල රජු විසින් භික්ෂූන් වහන්සේලා උදෙසා සිව්පසයෙන් දානය පිරිනැමීම, ධර්මධර, ශාස්ත්‍රධර පඬිවරුනට අනුරූප වෘත්ති ලබා දීම හා කඨිනදාන, දේවදාන මෙන් ම වාර්ෂිකව මහණදම් පින්කම් සංවිධානය සිදු කර ඇති බව ගල්පොත අභිලේඛනයේ සඳහන් වේ.

**පර්යේෂණ නිගමනය**

නිශ්ශඞ්කමල්ල රජතුමා සමකාලීන අභිලේඛන රැසකින් ම බෞද්ධ රාජ ප්‍රතිපත්ති හා භික්ෂුශාසනය පිළිබඳ ව හා බුදුදහමේ චිරස්ථිතිය සඳහා සිදු කරන ලද ලෝක ශාසනික සේවා රැසක් සන්නිවේදන කර ඇති නිසා සිය පාලන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී බුදුදහමේ ආභාසය ලබා ගෙන ඇති ආකාරයක් හඳුනා ගත හැකි ය.

**පර්යේෂණ යෝජනාව**

පුරාතන යුගයේ සිට ලංකාව බෞද්ධ රාජ්‍යයක් බවත් එහි පාලනය බුදුදහමට ප්‍රමුඛස්ථානය ලබා දෙමින් පැවැති සම්ප්‍රදාය අඛණ්ඩව පොළොන්නරු අවධියේත් පැවැතීම නිසා නිශ්ශඞ්කමල්ල රජු ලක්දිව රාජ්‍යත්වය ලබා ගැනීමේ දී හා පාලනය මෙහෙයවීමේ දී මුහුණ දුන් අභියෝගයන් ජයග්‍රහණය කිරීමට බෞද්ධ ආගමික ප්‍රතිපත්තියට අනුකූලව පාලනය ගෙන යන බව ජනමතයක් ගොඩනැඟීමට සිය පාලන ප්‍රතිපත්ති සඳහා බෞද්ධ ආගමික ප්‍රතිපත්ති යොදාගත් බව යෝජනා කළ හැකි ය.

**ප්‍රමුඛ පදඃ** අභිලේඛන, නිශ්ශඞ්කමල්ල රජු, පොළොන්නරුව, බුදුදහම, රාජ්‍ය තන්ත්‍රය

මූලාශ්‍රය


- Don Martino & De Silva Wikramasinghe (1928). **Epigraphia Zeylanica Vol.I.** Published For The Government Of Ceylon By Humphrey Milford. Oxford University Press.
- අමරවංශ හිමි, කොත්මලේ (1969). **ලක්දිව සෙල්ලිපි.** කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
- කරුණාරත්න, සද්ධාමඞ්ගල (2000). **ශිලාලේඛන සඞ්ග්‍රහය - I වෙළුම.** බොරැල්ලඃ රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව.
- රෝහණදීර, මැන්දිස් (1998). **නිශ්ශඞ්කමල්ල.** මහරගමඃ තරංජි ප්‍රින්ට්ස්.
- විමලවංශ හිමි, බද්දේගම (1959). **සෙල්ලිපි සමාජය.** අනුල මුද්‍රණාලය.